සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2018
First Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 8 | විෂයය / பாடம் / Subject බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper I,II | පැය / மணித்தியாலம் / Hours 2 |

නම .................................................................. විභාග අංකය ...................................................

1 සිට 20 දක්වා සියළුම ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

01. ඉද ඉද එක වෙහෙර
විඳ විඳ දහම් මනහර
සිඳ බිඳ දුක් සසර
අහෝ දෙව්දත් නොදිටි මොක් පුර

දෙව්දත් තෙරුන් වහන්සේ පිළිබඳ ඉහත සඳහන් කවිය ඇතුළත් වන්නේ,
(i) ලෝකෝපකාරයේ ය. (ii) ගුත්තිල කාව්‍යයේ ය.
(iii) සුභාෂිතයේ ය. (iv) ලෝවැඩ සඟරාවේ ය.

02. එළියේ වාඩි වී සුදු රෙදි කඩක් අතට දී "රජෝ හරණං, රජෝ හරණං" යනුවෙන් කියමින් භාවනාවක් කිරීමට බුදු රජාණන් වහන්සේ කියා දී එමගින් ධර්මය අවබෝධ කරගැනීමට යොමු කළේ,
(i) චුල්ලපන්ථක පොඩි හාමුදුරුවන් ය. (ii) මහාපන්ථක පොඩි හාමුදුරුවන් ය.
(iii) රාහුල පොඩි හාමුදුරුවන් ය. (iv) නන්ද පොඩි හාමුදුරුවන් ය.

03. මහනෙල් සුවඳම ය
කුඩමසු පිළී ගඳම ය
දෙකට එක දියම ය
හොඳට නරකට දෙකට කටම ය

ඉහත පද්‍යය රචනා කරන ලද්දේ,
(i) සිරි සරණංකර සංඝරාජ හිමි විසිනි. (ii) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි විසිනි.
(iii) පැළැනේ සිරි වජිරඤාණ හිමි විසිනි. (iv) වැත්තෑවේ හිමි විසිනි.

04. බොදු දරුවන් වන අප බුදුරජාණන් වහන්සේ ආදර්ශයට ගනිමින් ආගන්තුකයන් පිළිගෙන සුහද කථා බහෙන් ද කළ යුතු සංග්‍රහයෙන් ද ඔවුන් සතුටු කිරීමට පුරුදු විය යුතුය. ඒ සඳහා බුද්ධචරිතයෙන් ආදර්ශ ගත හැකි අවස්ථාවක් වන්නේ,
(i) මහා පන්ථක හාමුදුරුවන්ට ධර්මය දේශනා කිරීම.
(ii) ආනන්ද තෙරුන් වහන්සේට ධර්මය දේශනා කිරීම.
(iii) සෝණදණ්ඩ බමුණාට ධර්මය දේශනා කිරීම.
(iv) පිරිනිවන් මංචකයේ සිටියදී සැකයක් දුරු කරගැනීමට සුභද්‍ර භික්ෂුවට පැමිණීමට අවසර ලබාදීම.

05. පාසල තුළ නිවසේදී හා සමාජයේ ඕනෑම ස්ථානයකදී අප ආචාරශීලීව හැසිරිය යුතුය. ඒ සඳහා අප පුරුදු පුහුණු කරගත යුතු උතුම් සමාජ ආචාර ධර්මයක් වන්නේ,
(i) අල්පශබ්දතාවය යි. (ii) අදහස් ප්‍රකාශ කිරීමයි.
(iii) ගුරුවරුන්ට කීකරු වීමයි. (iv) සමාජයට සේවය කිරීමයි.

06. තමාගේ වෙනත් කටයුතු සියල්ල පසෙකින් තබා සිතට නඟා ගැනීමට සුදුසු බැවින් ධර්මය,
(i) ඒහි පස්සික වේ. (ii) අකාලික වේ.
(iii) ඕපනයික වේ. (iv) ස්වාක්ඛාත වේ.

07. බුදුගුණ ඇතුළත් මංගල අෂ්ටක කියවීම,
(i) උපන්දින උත්සව චාරිත්‍රයකි. (ii) පිරිත් පිංකම් චාරිත්‍රයකි.
(iii) අකුරු කියවීමේ චාරිත්‍රයකි. (iv) සරණ මංගල්‍ය චාරිත්‍රයකි.

08. නත්ථි මේ සරණං අඤ්ඤං - බුද්ධෝ මේ සරණං වරං
ඒතේන සච්ච වජ්ජේන - හෝතු මේ ජය මංගලම්.

ඉහත සඳහන් ගාථාව,
(i) පැන් වැඩීමේ ගාථාවකි. (ii) ආරක්ෂක ගාථාවකි.
(iii) පිරිත් ආරාධනා ගාථාවකි. (iv) ජයමංගල ගාථාවකි.

09. පුහුදුන් මිනිසෙකුට අත්පත් කොට ගත නොහැකි අසීමිත ගුණ සමුදායක් බුදුවරයෙකුට පවතී. එම නිසා බුදු ගුණ,
(i) කෙත් යායකට උපමා කර දක්වයි. (ii) නෙළුම් මලකට උපමා කර දක්වයි.
(iii) සයුරකට උපමා කර දක්වයි. (iv) විශාල නැවකට උපමා කර දක්වයි.

10. මහමග ගමන් ගත් ඡත්ත නම් තරුණයා මග රැක සිට සොරු කණ්ඩායමකින් මරුමුවට පත් විය. ඔහු නිදා පිබිදියාක් මෙන් මරණින් පසු දෙව්ලොව ඉපදුණේ,
(i) පෙර කරන ලද කුසල කර්මයක් නිසාය. (ii) තෙරුවන් ගුණ සිහිපත් කළ නිසාය.
(iii) ඔහුට පින් අනුමෝදන් කළ නිසාය. (iv) ඔහුගේ ආයුෂ අවසන් වූ නිසාය.

11. බුදුගුණ භාවනාව වැඩීමට සූදානම් වන ඔබ මුලින් ම කළ යුත්තේ,
(i) සමාධි බුද්ධ ප්‍රතිමාවක් ඉදිරිපස මල් පහන් පූජා කිරීමයි.
(ii) මුව දොවා දැත් දෙපා පිරිසිදු කොට පිරිසිදු ඇඳුමකින් සැරසීමයි.
(iii) බුද්ධ ප්‍රතිමාව අබියස පහසු ඉරියව්වකින් තැන්පත් වීමයි.
(iv) උඩුකය ඍජුව තබා ගනිමින් වම් අත්ල මත දකුණු අත්ල තබාගෙන හොඳින් හුස්මක් පිට කිරීමයි.

12. බුදුරජාණන් වහන්සේ උතුම් වූ චතුරාර්ය සත්‍යය ගුරු උපදේශ නැතිව ම තමාගේ නුවණින් ම අවබෝධ කොට ගත් නිසා,
(i) 'අරහං' නම් වන සේක. (ii) 'විජ්ජාචරණසම්පන්න' නම් වන සේක.
(iii) 'සුගත' නම් වන සේක. (iv) 'සම්මා සම්බුද්ධ' නම් වන සේක.

13. බුදුරජාණන් වහන්සේගේ ධර්මය පිළිබඳ කෙටියෙන් උපතිස්ස පිරිවැජියාට දේශනා කරන ලද්දේ,
(i) කොණ්ඩඤ්ඤ තවුසා විසිනි. (ii) අස්සජි තෙරණුවන් විසිනි.
(iii) සංජය පිරිවැජියා විසිනි. (iv) ආනන්ද තෙරණුවන් විසිනි.

14. තම ආචාර්යවරයා වෙසෙන දිශාවට හිසලා සැතපෙන්නේ,
(i) සැරියුත් තෙරණුවන් ය. (ii) මුගලන් තෙරණුවන් ය.
(iii) නන්ද තෙරණුවන් ය. (iv) වප්ප තෙරණුවන් ය.

15. ශ්‍රද්ධා බලය යොදා ගනිමින් මච්ඡරිය කෝසිය සිටුතුමා මසුරුකමින් මුදවාලීමට කටයුතු කරන ලද්දේ,
(i) ආනන්ද මහ රහතන්වහන්සේ විසිනි.
(ii) මුගලන් මහ රහතන් වහන්සේ විසිනි.
(iii) සැරියුත් මහ රහතන් වහන්සේ විසිනි.
(iv) මහා කාශ්‍යප මහරහතන් වහන්සේ විසිනි.

16. පිරිනිවන් පෑමට ආසන්න අවස්ථාවේදී සිය මෑණියන් සඳහා නිවන් මග කියා දී සෝවාන් ඵලයෙහි පිහිට වූ රහතන් වහන්සේ වන්නේ,
(i) මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේ ය.
(ii) මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ය.
(iii) රේවත මහ රහතන් වහන්සේ ය.
(iv) සැරියුත් මහ රහතන් වහන්සේ ය.

17. අපි දිනපතා පංචසීලය සමාදන් වන්නෙමු. ඉන් පළමු ශික්ෂාපදයෙහි අදහස වන්නේ,
(i) සොරකම් කිරීමෙන් වැළකෙමි යන්නයි.
(ii) පරපණ නැසීමෙන් වැළකෙමි යන්නයි.
(iii) බොරු කීමෙන් වැළකෙමි යන්නයි.
(iv) සුරාපානය කිරීමෙන් වැළකෙමි යන්නයි.

18. බුදුරජාණන් වහන්සේගේ උතුම් වූ තෙමඟුල සමරන පෝය දිනය වන්නේ,
(i) උඳුවප් පුර පසළොස්වක පෝය දිනයයි.
(ii) ඇසළ පුර පසළොස්වක පෝය දිනයයි.
(iii) වෙසක් පුර පසළොස්වක පෝය දිනයයි.
(iv) පොසොන් පුර පසළොස්වක පෝය දිනයයි.

19. බෞද්ධයන් වන අප විහාරස්ථානයකට ගොස් ත්‍රිවිධ චෛත්‍ය වන්දනා කිරීමේදී අනුපිළිවෙළකට වන්දනය කළ යුතුයි. එසේ වන්දනය කිරීමේ අනුපිළිවෙල වන්නේ,
(i) ශාරීරික චෛත්‍ය, පාරිභෝගික චෛත්‍ය, උද්දේසික චෛත්‍ය
(ii) පාරිභෝගික චෛත්‍ය, උද්දේසික චෛත්‍ය, ශාරීරික චෛත්‍ය
(iii) උද්දේසික චෛත්‍ය, පාරිභෝගික චෛත්‍ය, ශාරීරික චෛත්‍ය
(iv) ශාරීරික චෛත්‍ය, උද්දේසික චෛත්‍ය, පාරිභෝගික චෛත්‍ය

20. සංඝමිත්තා තෙරණින් වහන්සේ ජය ශ්‍රී මහා බෝධි දක්ෂිණ ශාඛාව රැගෙන ලක්දිවට වැඩම කළේ,
(i) පොසොන් පුර පසළොස්වක පොහෝ දිනක ය.
(ii) ඇසළ පුර පසළොස්වක පොහෝ දිනක ය.
(iii) වෙසක් පුර පසළොස්වක පොහෝ දිනක ය.
(iv) උඳුවප් පුර පසළොස්වක පොහෝ දිනක ය.

**(ලකුණු 2 x 20 = 40)**

# බුද්ධ ධර්මය II

පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

01. පළමු පාසල් වාරයේදී ඔබ විසින් නිර්මාණය කරන ලද බිත්ති පුවත්පත ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) බිත්ති පුවත්පත සකස් කිරීම සඳහා පවරන ලද කණ්ඩායම්වල නම් ලියන්න.

(ii) බිත්ති පුවත්පත සකස් කිරීමේදී ඔබ කණ්ඩායමට හිමි වූ මාතෘකාව කුමක්ද?

(iii) ඒ සඳහා ඔබ තොරතුරු සපයා ගත් මූලාශ්‍ර දෙකක් ලියන්න.

(iv) බිත්ති පුවත්පත සකස් කිරීම සඳහා ඔබේ ගුරුතුමා/ගුරුතුමිය ඔබට දුන් උපදෙස් දෙකක් ලියන්න.

(v) උපතේ සිට මරණය දක්වා ජීවිතයේ වැදගත් අවස්ථාවලදී සිදුකරන උත්සව දෙකක් නම් කරන්න.

(vi) නිවසක පැවැත්වෙන පිරිත් පිංකමකදී ඔබ විසින් ඉටුකරන චාරිත්‍ර දෙකක් ලියන්න.

(vii) ඔබේ උපන්දිනය දා ඔබ විසින් කරන ලද චාරිත්‍ර දෙකක් ලියන්න.

(viii) බිත්ති පුවත්පත සකස් කිරීමේදී ඔබට මුහුණ පෑමට සිදු වූ ගැටළු දෙකක් ලියන්න.

(ix) එම ගැටළු විසඳා ගැනීමට ඔබ යෙදූ ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.

(x) බිත්ති පුවත්පත සකස් කිරීමෙන් ඔබ ලැබූ අත්දැකීම් දෙකක් ලියන්න.

**(ලකුණු 2 x 10 = 20)**

02.

(i) දෙව්දත් තෙරුන් බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලා සිටි පංච වරවලින් දෙකක් නම් කරන්න. **(ලකුණු 02)**

(ii) කාන්තාවන්ට පැවිදි බව ලබාදීමේදී බුදුරජාණන් වහන්සේ මහා ප්‍රජාපතී ගෝතමිය වෙත ඉදිරිපත් කළ අෂ්ට ගරු ධර්මවලින් තුනක් නම් කරන්න. **(ලකුණු 03)**

(iii) පැවිද්දේ කලකිරුණු නන්ද හාමුරුවන්ගේ කතා පුවතින් ලබාගත හැකි ආදර්ශ පහක් ලියන්න. **(ලකුණු 05)**

03.

(i) බුදුරජාණන් වහන්සේගේ චරිතයේ පිළිබිඹු වන ආචාරශීලී ගුණාංගයන්ගෙන් දෙකක් නම් කරන්න. **(ලකුණු 02)**

(ii) ඉන් එකක් පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. **(ලකුණු 03)**

(iii) ප්‍රියශීලී උදාර ජීවිතයක් ගොඩනගා ගැනීමට එම ගුණාංග ඉවහල් වන ආකාරය පේළි පහකින් පමණ විස්තර කරන්න. **(ලකුණු 05)**

04.

(i) ධර්ම රත්නයේ ගුණවලින් දෙකක් නම් කරන්න. **(ලකුණු 02)**

(ii) ඉන් එක් ගුණයක් පිළිබඳව කියැවෙන ඔබේ පෙළපොතේ සඳහන් කවියක් ලියන්න. **(ලකුණු 03)**

(iii) ඔබේ ලෙඩට දුකට ධර්ම රත්නයේ පිහිට ඉවහල් වන අයුරු පැහැදිලි කරන්න. **(ලකුණු 05)**

05. සෝ මේ ආචරියෝ ආසී
අස්සජි නාම සාවකෝ
....................................
....................................

(i) ඉහත ගාථාවේ ඉතිරි පද සම්පූර්ණ කරන්න. **(ලකුණු 02)**
(ii) එම ගාථාවේ අදහස ලියන්න. **(ලකුණු 03)**
(iii) සැරියුත් තෙරණුවන්ගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ පහක් ලියන්න. **(ලකුණු 05)**

06.
(i) නව අරහාදී බුදුගුණවලින් හතරක් ලියන්න. **(ලකුණු 02)**
(ii) ඉන් එකක අදහස ලියන්න. **(ලකුණු 03)**
(iii) බුදුගුණ භාවනාවේ ආනිශංස පහක් ලියන්න. **(ලකුණු 05)**

07.
(i) සිරිත් හා විරිත් යනු කුමක්දැයි හඳුන්වන්න. **(ලකුණු 02)**
(ii) බෞද්ධ නිවසක සිදු කරන අවමංගල චාරිත්‍ර තුනක් ලියන්න. **(ලකුණු 03)**
(iii) සිරිත් විරිත් පිළිපැදීම නිසා ඔබේ ජීවිතය සාර්ථක කර ගන්නා ආකාරය පේළි පහකින් පමණ විස්තර කරන්න. **(ලකුණු 05)**